**ISBN 978- 955-4563- 71- 1**

# ශ්‍රී ලංකාවේ මුල්කාලීන වාණිජ බැංකු: තෝනිගල සෙල්ලිපිය ඇසුරින් විමසුමක්

**එච්.එම්.යමුනා වසන්ත කුමාරිහාමි හේරත්, බැරගම සද්ධානන්ද හිමි**
**පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය හෝමාගම**

**සංක්ෂේපය**

***ක්‍රි.ව. 4 වන සියවසේ අනුරාධපුර යුගයේ රජ කළ කීර්ති ශ්‍රී මේඝවර්ණ (ක්‍රි.ව. 301- -. 328) රජුට අයත් තෝනිගල සෙල්ලිපිය බොහෝ විද්වතුන්ගේ පිළිගැනීම ශ්‍රී ලංකාවේ පැවති පැරණි බැංකු ක්‍රමය පිළිබඳව පූර්ණතම සඳහන මෙම ලේඛනය වන බවයි. මෙම ලිපියෙහි අරමුණ ශ්‍රී ලංකාවේ මුල්කාලීන ආර්ථික පසුබිම පෝෂණය කළ වාණිජ බැංකුවල ස්වරූපය පිළිබඳවත් තත්කාලීන සමාජයේ පැවති දේශපාලනික, ආගමික හා සාමාජික පසුබිම පිළිබඳව තෝනිගල සෙල්ලිපිය ඇසුරින් අධ්‍යයනය කිරීමයි.***

**මුඛ්‍ය පද**
**අනුරාධපුර යුගය, කීර්ති ශ්‍රී මේඝ, තෝනිගල සෙල්ලිපිය, මුල්කාලීන වාණිජ බැංකු**

## හැඳින්වීම

අඛණ්ඩ ලේඛන ඉතිහාසයක් සහිත රටවල් කිහිපය අතුරෙන් ශ්‍රී ලංකාවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත මෙම ලේඛන සම්ප්‍රදායේ එක් කොටසක් බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවේ ශාසන ඉතිහාසය ලියා තැබීමේ අරමුණින් රචිත දීපවංශය හා මහාවංශය ආදී සාහිත්‍ය මූලාශ්‍රයෝ වන අතර අනෙක් කොටස ක්‍රි.පූ. යුගයේ සිට බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ඉදි කළ ස්වභාවික ගුහාවල හා ගල් පර්වතවල කොටන ලද සෙල්ලිපි මූලාශ්‍ර වෙති.

මෙම ඓතිහාසික ලේඛන කෙටීමෙහි අරමුණ බෞද්ධ ආගමික ආයතන වෙත පරිත්‍යාග කරන ලද දීමනා ප්‍රකාශයට පත් කිරීම වුව ද සමකාලීන සමාජයේ පැවති ආගමික, ආර්ථික, දේශපාලනික හා සාමාජික ස්තරායනයන් පිළිබඳව අඩු වැඩි වශයෙන් තොරතුරු අන්තර්ගත වීම වැදගත් කොට සැලකිය හැකිය. මේ වන විට දිවයිනේ නන්දෙසින් සෙල්ලිපි දහස් ගණනක් සොයා ගෙන ඇති අතර ශ්‍රී ලංකාවේ පැරණි බැංකු ක්‍රම ගැන සඳහන් තෝනිගල සෙල්ලිපිය ඒ අතර ප්‍රධාන වේ.

## ගමන් මාර්ගය හා පිහිටීම

වව්නියාවේ සිට හොරොව්පොතානට පිවිසෙන මාර්ගයේ 6 වන සැතපුම් කණුවට මදක් නුදුරින් උතුරු දිශාවට වන්නට උතුර සහ- උතුරු මැද දෙපළාත වෙන් කරන සීමාවෙ හි තිලක්කුලම නම් පෙදෙසේ පිහිටි ගල් තලාවක් මත තෝනිගල සෙල්ලිපිය පිහිටුවා ඇත. එසේම 'නාගරගල' යන නමින් ද මෙම ස්ථානය ගම් වැසියෝ හඳුන්වනු ලබති. සෙල්ලිපිය පිහිටි පර්වතය හාත්පස බෙහෙවින් විනාශයට පත්ව ඇති විවිධ ආරාමික වාස්තුවිද්‍යාත්මක අවශේෂයන් බොහොමයක් දක ගැනීමට පුළුවන. මෙම නටඹුන්වල ට ආසන්නව ගල්තලාවේ වෙන් වෙන්ව සටහන් කළ සෙල්ලිපි තුනක් දකගත හැකි ය. මින් එකක් අපගේ මාතෘකාවට අදාල සෙල්ලිපිය වන අතර අනෙක එම සෙල්ලිපියේ ම තවත් පිටපතක කොටසකි. ඇතැම්විට ප්‍රථමයෙන් ලියන්නට පටන් ගන්නට ඇත්තේ දෙවැනියට කී සෙල්ලිපිය විය හැකි ය. එය කෙටීමේ දී සිදු වූ කිසියම් දෝෂයක් නිසාවෙන් ලිපිය බාගෙට කොටා නවතා දමා නව ලිපිය සම්පූර්ණ වශයෙන් සටහන් කළා වීමට පිළිවන. අනෙක් තුන්වන ලිපිය තෝනිගල ප්‍රධාන ලිපියට සියවස් කිහිපයකට පෙර ලියන ලද තනි අක්ෂර පෙළකින් යුතු ලිපියකි. කෙසේ නමුත් මෙම ලිපිය මෙතෙක් පල කළ බවට සාධක දක්නට නොලැබේ. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා පවා දක ඇත්තේ මුලින් සඳහන් කළ ලිපි දෙක පමණි. (Paranavithana.1933:197). නමුත් මෙහි දී අපගේ අවධානයට යොමුවන්නේ අක්ෂර පේළි 17 කින් යුතු ප්‍රධාන ලිපිය පිළිබඳව ය. මෙහි මුල් අක්ෂර පේළි හතර අඩි 9 1/2 ක් පමණ දිගකින් ද පස්වන පේළියේ සිට දහසය දක්වා ඇති පේළි අඩි 7 ක් පමණ හා අවසාන පේළිය අඩි 2 ක් දිගින් යුක්ත ය. අඩි 10 ක පමණ ප්‍රදේශයේ පැතිරුණු ලිපියෙහි එක් අක්ෂරයක සාමාන්‍යය ප්‍රමාණය වන්නේ අඟල් 3 ක් පමණ ය.


**ISBN 978- 955-4563- 71- 1**

මෙම ලිපිය පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් පළමු වතාවට සිදුකර ඇත්තේ සෙනරත් පරණවිතාන මහතා විසිනි. (Paranavithana.1933:172-188). ඒ මහතා සඳහන් කරන පරිදි මෙම ලිපිය පිළිබඳව පළමුවෙන් 1886 දී හෙන්රි පාකර් මහතා වර්තා කොට ඇති බවත්, එසේම 1892 දී එවකට සහකාර පුරාවිද්‍යා කොමසාරිස් වරයා ලෙස කටයුතු කළ ඩී.එම්.එස්. වික්‍රමසිංහ මහතා මෙහි තිබූ ලිපි පිටපත් කර එම වර්ෂයේ ම පාලන වාර්තාවේ ශිලා ලිපි ලැයිස්තුවේ අංක 34, 35 යටතේ වර්තා කර ඇති බව සඳහන් වේ. එච්.සී.පී. බෙල් මහතාගේ අධීක්ෂණයෙන් යුතුව මෙම ලිපියේ නේත්‍ර පිට පතක් සකසන ලදු ව එය තවමත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්තා අතර තිබුන ද මෙම ලිපිය කිසිවකුත් විසින් සාර්ථකව කියවා ඉදිරිපත් නොකළ බව ද වාර්තා කර ඇත. (Paranavithana.1933:19-72).

**ලිපියේ පෙළ :-**

01 - **සි (*) පුවිය මහසෙන මහරජ පුත සිරිමෙකවණ අබ මහරජහ චත ලෙගි**
02 - **තනක තිණවනක වසහි (*) නකරහි උතරපසහි කළහුමනක නියම තනහි සිය අ-**
03 - **විය කිණියෙහි නිකත කඩුබලගමකෙහි වසනක අමෙති පහෙජ සිවය**
04 - **හ පුත දෙවයහ යහිසපවය නව වහෙරකෙහි දින අරිය ව**
05 - **ස වට වී දෙ හකඩ දස අමණක වී ඉව ස අමණක**
06 - **උදි ඉව බයලි දස අමණ ඉව (*) මෙ දෙ හකඩ දස අ-**
07 - **මණක වී පිටදඩ හසහි වෙඩ අකල හසහි වෙඩ ම-**
08 - **දෙ හසහි වෙඩ පචවිසිය අමණක වී ඉව මෙ ස අමණක උදිහි**
09 - **වෙඩ එක අමණ දෙ පෙකඩක උදි ඉව දස අමණක බයලිහි වෙඩ දෙ අ**
10 - **මණ දෙ පෙකඩක බයලි ඉව (*) මෙ වතක වනහි ගහෙ කිණිය චිටවය වෙ**
11 - **ඩ ගෙණ තිණඩ හකට දන වට ඉචි අතරකජක වට ඉව අතරකජ**
12 - **(පරි) කර යපෙනි ඉව දී මිය චට පෙණි තිල ඉව බුතතෙල ඉව ලොණ ඉව**
13 - **පලහ වට ඉව වෙටයල ඉව වහෙර : ග සර ප පචනහි**
14 - **මිලිය පදිය ඉව (*) මෙව (තක) වෙඩවතක ගෙණ වනය ව(න)ය**
15 - **අතොවසහි නිකමණිය චද පුණමස දොළෂ පක දිවස**
16 - **(අ) රියවස කරන මහ බිකුසගහට නියත කොටු යහිසපව(තන)**
17 - **ව වහෙරකහි දිනි (*)** (E,z.Vol.iii.p.177.178)

ISBN 978- 955-4563- 71- 1



(E.Z.vol.iii,Plate 14)

**අර්ථය**

මංගලයක් වේවා. පෘතුවීශ්වර (පෙරසිටි) මහසෙන මහ රජුගේ පුත්‍ර වූ සිරි මේඝවණ්ණ අභය මහරජතුමා සේසත් එස වූ තුන්වන වර්ෂයේ දී නගරයෙ හි උතුරු දිශාවේ 'කලහුමනක' නම් වෙළඳ සභාවේ (බැංකුවේ)තමා විසින් පරිත්‍යාග කරනලද වස්තුව අඩුවීමක් හෝ හීනවීමක් නොවන ලෙස කඩුබලගම වාසය කරන අමාත්‍යය පර්ෂදයේ සිවගේ පුත්‍රයා වන දේව විසින් යහිස පර්වතයෙහි අභිනව විහාරයට දෙන ලද අරියවංශ වෘත්තිය පැවැත්වීම සඳහා වී සකට (කරත්ත) දෙකක් හා දස අමුණක වී ද අමුණු හයක උඳු ද මුං ඇට අමුණු දහයක් ද දෙන ලදි. මෙම දස අමුණක වී වල මහකන්නයේ පොළිය ද යළකන්නයේ පොළිය ද මැදකන්නයේ පොළිය ද වශයෙන් අමුණු විසිපහක වී ද උඳු හය අමුණක පොළිය උඳු එක අමුණු පෙකඩ දෙකක් ද මුං දස අමුණක පොළිය අමුණු දෙකයි පෙකඩ දෙකක්ද වේ. මේ ඉහත කී තැන්පතුවේ මූල ධනය වෙනස් නොකොට පොළිය ගෙන බත් සඳහා ද අතුරුපස කෑමට ගන්නා ආහාර මී කිරි, මී පැණි, කැවිලි, තල, දුන් තෙල්, ලුණු, පළා වර්ග සහ කහ සඳහා ද විහාරස්ථානයේ භෝජන ශාලාවේ ආහාර පිසින කටයුතු ගෙවීම සඳහා ද දිය යුතුය. මෙකීතාක් වස්තුව එහි පොළියෙන් ගෙන පැමිණෙන පැමිණෙන වස්කාලයක් තුළ නිකිණි මස ශුක්ල පක්ෂයෙහි දොළොස් වන දිනයෙ හි අරියවංශ ප්‍රතිපදාව කරන මහා භික්ෂු සංඝයාට නියම කොට යහිස පර්වතයෙහි අභිනව විහාරයට දෙන ලදි.

**අන්තර්ගතය**

දේව නැමැත්තකු විසින් 'යහිස පර්වත විහාරයෙ'හි වැඩවසමින් අරියවංශ පූජාව පවත්වන භික්ෂූන්ගේ ප්‍රත්‍ය පහසුකම් සැලසීම සඳහා 'කළහුමනක' නම් වෙළඳ මධ්‍යස්ථානයෙහි වී, උඳු, මුං ආදිය තැන්පත් කොට එහි පොළිය සංඝයා ට ලැබෙන සේ සම්පාදනය කොට තිබීම මෙහි

**ISBN 978- 955-4563- 71- 1**

ප්‍රමුඛතම සඳහනයි. ඊට අමතරව ලංකාවේ භාවිත පැරණි බැංකු ක්‍රම, කෘෂිකාර්මික කටයුතු, මිණුම් ක්‍රම මෙන්ම තත්කාලීන ආගමික, ආර්ථික හා සාමාජික තත්ත්වය පිළිබඳව කරුණු අන්තර්ගතව පවතී.

**විමර්ශනය**

ක්‍රිःවः සිව්වන සියවසේ ලක්දිව පැවති සමාජ තොරතුරු අධ්‍යයනය කිරීම සඳහා බෙහෙවින් ඉවහල් වන මෙම ලේඛනයෙන් පහත කරුණු අනාවරණය කරගත හැකිය.

- ❖ දේශපාලනික තොරතුරු
- ❖ ආර්ථික තොරතුරු
- ❖ ආගමික තොරතුරු
- ❖ සාමාජික තොරතුරු

**දේශපාලනික තොරතුරු**

දේශපාලනික වශයෙන් තොරතුරු අධ්‍යයනය කිරීමෙ දී ලංකා ඉතිහාසයේ වාර්තා වී ඇති ප්‍රබල රාජ්‍ය පාලකයන් දෙදෙනෙකු පිළිබඳව මෙහි සඳහන් ය. ඔවුන් නම් මහසෙන් මහ රජු සහ කිත්සිරිමේඝ යන පාලකයන්ය. පිය පුතු සබඳතාවක් ඇති මෙම රජවරුන් දෙදෙනා පිළිබඳව සෙල්ලිපියේ සඳහන් ව ඇත්තේ **'' පුවිය මහසෙන මහරජ පුත සිරිමෙකවණ අබමහරජහ''** යනුවෙනි.

**පුවිය මහසෙන මහරජः-**
මෙම සෙල්ලිපිය පිහිටවනු ලබන්නේ කිත්සිරිමේඝ රාජ්‍ය සමයේ වුව ද එම රජු ගේ පියා වූ මහසෙන් (ක්‍රිːව. 274-301) රජු පිළිබඳව සඳහන් කරනු යේ කිත්සිරි මෙවන් රජුට ඇති රාජ්‍ය උරුමය පිළිබඳව දැක්වීමට මෙන්ම ජනතා ප්‍රසාදය ඇතිකර ගැනීමට විය යුතු ය. මහාවංශයට අනුව මහසෙන් රජු ගෝඨාභය (ක්‍රිःව.249-262) රජු ගේ පුත්‍රයෙකි. මහසෙන් රජතුමා මහා විහාරය සමඟ උරණව එම විහාරයට දැඩි හානි සිදුකල බව මහාවංශයේ සඳහන් ය. (මහාවංශය 1960:37,316). මෙම ලිපියේ 'මහසෙන මහරජ' යන සංඥා නාමයට ඉදිරියෙන් ඇති 'පුවිය' යන පදයෙන් පෘතුවීශ්වර හෝ පෙර සිටි යන අදහස අර්ථවත් කරන බව උගතුන්ගේ මතය යි. (E.Z.Vol iii. p.179)

**සිරිමෙකවණ අබමහරජහ**

සෙල්ලිපියේ සඳහන් තොරතුරුවලට අනුව ලිපියට අදාල කාල පරිච්ඡේදය තුළ පාලකයා වන්නේ කිත්සිරි මෙවන් මහරජ තුමාය. (ක්‍රිःව.301-328) මහාවංශයේ සඳහන් පරිදි තම පියාගෙන් පසු රාජ්‍යත්වයට පත්වන ඔහුගේ රාජ්‍ය කාලය ප්‍රධාන වශයෙන් කැප කරන ලද්දේ සංඝමිත්ත භික්ෂුව ගේ සහ සෝණ අමාත්‍යවරයාගේ කුට උපදේශ අනුව මහා විහාරය හා ඊට අයත් ආයතන විනාශ කළ තම පියාණන් ගේ හෙවත් මහසෙන් රජුගෙන් සාසනයට සිදු වූ ව්‍යසනයන් සමනය කිරීමට බව පෙනීය යි. එසේම සිරි මේඝවණ්ණ රජ තෙමේ තම සමකාලීනයෙකු වූ සමුද්‍රගුප්ත නැමැති ශ්‍රේෂ්ඨ ඉන්දියානු අධිරාජ්‍යයා සමග මිත්‍ර සම්බන්ධතා පැවැත් වූ බව සඳහන් වේ. මේ පිළිබඳව සමුද්‍රගුප්ත රජතුමාගේ 'අලහබාද්'ටැම් ලිපියෙහි මෙන්ම 'වංහුවේන් සුවේ' විසින් ලියන ලද ''හිංචෝවන්'' නැමති චීන ග්‍රන්ථයෙහි ද සඳහන් වේ. සිරි මේඝවණ්ණ රජුගේ රාජ්‍යය සමය ඉතා හොඳින් සිහිපත් කරවන සිද්ධිය නම් පසු කාලීන සිංහල රජවරුන්ගේ ඉෂ්ඨ දේවතාවා බවට පැමිණි දන්ත ධාතුන්වහන්සේ මෙහි වැඩම කරවනු ලැබීම යි. රජුගේ නවවැනි රාජ්‍ය වර්ෂයේ දී කාලිංග රජුගේ දූ කුමරිය බැමිණි වෙසින් දන්ත ධාතුව මෙහි වැඩම වූ බවත් එය එබඳු පූජනීය වස්තුවලට සුදුසු ගෞරවයෙන් යුක්තව පිළිගන්නා ලද බවත් සඳහන් වේ.(ජයවර්ධන 1964:279).

**ISBN 978- 955-4563- 71- 1**

**අමෙති පහෙජ සිවය හ පුත දෙවයහඃ-**
මෙහි සිවගේ පුත්‍ර දේව නැමැත්තෙකු ගැන සඳහන් වේ. ඇත්ත වශයෙන්ම මෙම සෙල්ලිපියේ කතුවරයා වන්නේ ද දේව නැමැත්තා ය. ඔහු විසින් කරන ලද පරිත්‍යාග සම්බන්ද තොරතුරු මෙම ලිපියේ සඳහන් ය. ඉහත සදහනට අනුව ඉතා පැහැදිලි ලෙස සිවගේ පුත්‍රයා දේව වන බව පෙනෙයි. මෙම සිව නැමැත්තා අමාත්‍යය මණ්ඩලයට අයත් අයෙකු බව 'අමෙති පහෙජ' යන යෙදුමෙන් පැහැදිවේ. පරණවිතාන මහතා සදහන් කරන පරිදි පහෙජ යන වචනය සංස්කෘත 'පර්ෂද' හා පාලි 'පාරිසජ්ජ' යන වචනයෙන් සිංහලයට "පහෙජ" යනුවෙන් බින්න වූවකි. (Paranavitana.1933:182)

**ආර්ථික තොරතුරු**

මෙම ශිලාලේඛනයෙන් ක්‍රිඃව. සිව්වන සියවස වනවිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෙමින් පැවති ආර්ථික කටයුතු පිළිබඳ වැඳගත් තොරතුරු විශාල ප්‍රමාණයක් අනාවරණය කරගැනීමේ හැකියාව පවතී. ඒ අනුව තත්කාලීන සමාජයේ ප්‍රධාන ආර්ථික ක්‍රම දෙකක් ක්‍රියාත්මක ව  තිබූ බව පෙනීය යි. එනම් කෘෂි ආර්ථිකය සහ වෙළද ආර්ථිකය වශයෙනි.

**කෘෂි ආර්ථිකය**

ක්‍රිඃවඃ සිව්වන සියවස වන විට වංශකථා සාධකවල ට අනුව මෙන්ම සෙල්ලිපි සාධක වලට අනුව ද ශ්‍රී ලංකාවේ දියුණු කෘෂි කාර්මික ජීවන රටාවක් පැවති බව පැහැදිලිය. එහෙත් කෘෂි කර්මාන්තය පිළිබඳව වංශකථාවල සඳහන් නොවන අතුරු තොරතුරු විශාල ප්‍රමාණයක් මෙම ලිපියෙන් අනාවරණය කරගත හැකි වේ. විශේෂයෙන් වාපි ජල කර්මාන්ත රටාවක් ක්‍රියාත්මක වූ රජරට කලාපයේ කන්න තුනක් වගාකළ බව මෙම ලිපියෙන් පැහැදිලි ව සඳහන් වේ. පරණවිතාන මහතා හඳුන්වා දෙන පරිදි ''පිටදඩහස, අකලහස හා මදෙහස'' යනුවෙන් සෙල්ලිපියේ සඳහන් වන්නේ මහ කන්නය , යලකන්නය හා මැද කන්නය පිළිබඳව යි. මේ අනුව වැව් ජලයෙන් වසරකට කුඹුරු අස්වැන්න තුන්වරක් ගත් බව පැහැදිලි වේ. (Paranavitana.1933:185) මෙයින් පැහැදිලි වන්නේ මෙම සෙල්ලිපිය පිහිටුවන සමය වන විට උතුර නැගෙනහිර පලාතේ සංවිධානාත්මක වැව් පද්ධතියක් මෙන් ම ඒ වායෙන් ජලය බෙදා හරින වාරි පද්ධතියක් ද  ක්‍රමානුකූලව ක්‍රියාත්මක ව පැවති බවයි. විශේෂයෙන් ම මෙහි දී තම පියා වන මහසෙන් රජතුමාගේ වාරි තාක්‍ෂණික ක්‍රියාවළියේ සාර්ථකත්ත්වය සමග එහි ප්‍රතිඵල මෙම යුගයේ දී කෘෂි ආර්ථිකය මැනවින් පවත්වා ගැනීමට හේතුවන්නට ඇතිබව නිගමනය කළ හැකිය. මහසෙන් රජු විසින් කළ වැව් හා ඇළ මාර්ග පිළිබද දීර්ඝ විස්තරයක් මහාවංශයේ සදහන් වේ. (මහාවංශය 1960:37,319) පසුකාලීන ජන සමාජය තුළ මහසෙන් 'මින්නේරි දෙවියන්' වශයෙන් හැඳින්වීමට පුරුදුව ඇත්තේ ද සුභික්ෂය සඳහා කළ කාර්යයන් නිසා විය යුතුය.
මීට අමතර ව මෙම සෙල්ලිපියෙ හි  කිරි සහ බුන තෙල් හෙවත් දුන් තෙල් පිළිබඳව සඳහන් ව තිබීමෙන්  පැහැදිලි වන්නේ මී ගව සම්පත තත්කාලීන සමාජයේ පැවති බවයි. කුඹුරු අස්වැද්දී මේ හා නෙලීමේ කටයුතුවල දී මී ගවයන්ගෙන් විශාල උපකාරයක් ලැබෙන්නට ඇත. වර්තමානයේ ද ග්‍රාමීය ප්‍රදේශවල මී ගවයන්ගෙන් කෘෂි කර්මාන්තයට ලැබෙන පිටුබලය අතිමහත් ය. ඊට අමතරව ගවයන් වී ආදී ධාන්‍ය වර්ග ප්‍රවාහනය කිරීම සදහා ද යොදා ගන්නට ඇති බව සිතිය හැකි ය. ඒ අනුව ඉහත දක් වූ වී ගොවිතැන ඍජු ලෙස ම මඩ ගොවිතැනට අයත් වන අතර හේන් ගොවිතැන හා ගෙවතු වගාව පිළිබඳව ද මෙම ලිපියෙන් වැදගත් තොරතුරු අනාවරණය වේ. හේන් ගොවිතැන සම්බන්දයෙන් අවධානය යොමු කිරීමේ දී ප්‍රධාන භෝග වශයෙන් උඳු, මුං, තල ආදී ධාන්‍ය වර්ග වගාකොට ඇති අතර සමකාලීන සමාජයේ ගෙවතු වගාවන් ලෙස බුලත්, කහ, පළා වර්ග ආදී භෝග වගාවන් වගා කොට ඇති බව ද සනාත වේ.

**වෙළඳ ආර්ථිකය**

සමකාලීන වෙනත් සෙල්ලිපි මගින් අනාවරණය කරගත නොහැකි ප්‍රමාණයේ වෙළද ආර්ථිකය සම්බන්ද තොරතුරු ප්‍රමාණයක් මෙම ලිපියෙන් අනාවරණය කර ගත හැකි වේ. විශේෂයෙන් ම මෙහි කියැවෙන ''කළහුමනක නියමතන'' යන ආයතනය ඉතාම වැදගත් ය. පරණවිතාන මහතා සදහන් කරන්නේ පාලි භාෂාවේ ''නිගම'' යන්නෙන් සිංහලයට ''නියම'' යන පදය බිඳී ඇති

**ISBN 978- 955-4563- 71- 1**

බවත් ඉන් වෙළඳ ගම යන්න අර්ථවත් වන අතර '' තන'' යන පදය සංස්කෘත ''ස්ථන'' යන්නෙන් බිඳගත් ''ආස්ථාන'' හෙවත් සභාව යන්න අර්ථ දක්වන බවයි. ඒ අනුව වෙළඳ ගම්සභාව යන්න මීට දිය හැකි සුදුසු ම වචනය බව වැඩිදුරටත් කියා සිටී. (Paranavitana.1933:181) පරණවිතාන හඳුනාගන්නා මෙම වෙළඳ ගම්සභාව වර්තමාන බැංකුවක් මෙන් ක්‍රියා කරණ ලද්දක් බව පෙනීය යි. සෙල්ලිපියෙ හි කියැවෙන මෙම ආයතනයෙ නම ''කළහුමනක'' නම් වේ. කළහුමනක යන්න ග්‍රාමනාමයක් සමග බැඳුන එකක් හෝ ''කාලසුමන'' යන පුද්ගල නාමය සමඟ බැඳුන එකක් විය හැකි ය. කෙසේ නමුත් අතීතයේ තිබූ මෙවැනි ආයතන කිහිපයක් ම පිළිබඳව පෙරුමියන්කුලම, ලබු ඇට බැදිගල, බඳගිරිය ආදී සෙල්ලිපිවලින් පැහැදිලි වේ. පෙරුමියන්කුලම ලිපියට අනුව ''තිරගම''හා ''අමර''යන බැංකු දෙකක් පිලිබඳව කරුනු කියැවේ. (අමරවංශ හිමි 1969.118) මීට අමතරව ලබු ඇට බැදිගල සෙල්ලිපියේ නගරයේ නැගෙනහිර දිසාවෙහි තිබූ ''මහකබක'' නම් වෙළඳ මධ්‍යස්ථානයක් හෙවත් බැංකුවක් ගැන සඳහන් වේ. එම බැංකුවේ කහවනු සියයක් තැන්පත් කොට එහි පොළියෙන් අරියවංශ වෘත්තිය පැවැත්වීමට කටයුතු කළ බව සඳහන් ය. (කරුණාරත්න 1956:17-18)

තෝනිගල සෙල්ලිපියට අනුව එහි සඳහන් වන වෙළඳ සභාවේ නැතහොත් බැංකුවෙ හි ප්‍රාග් ධනය ලෙස තැන්පත් කොට ඇත්තේ වී, උඳු සහ මුං යන ධාන්‍ය වර්ගයන් ය. එහි දී වී අමුණු පනහක් ද උඳු අමුණු හයක් ද මුං අමුණු දහයක් ද වශයෙනි. මෙම තැන්පතු ධාන්‍යවලින් කැමති ප්‍රමාණයක් ඕනෑම අයෙකුට පරිහරණය සඳහා ලබා ගැනීමට හැකියාවක් තිබූ අතර ඔවුන් විසින් ආයතනයට සම්මත පොළිය ධාන්‍යවලින් ම ගෙවීම ට නියම ව තිබුණි. සෙල්ලිපියේ කියවෙන අන්දමට වී වලින් යල, මහ සහ මැද යන කන්න තුන සඳහා ම ස්ථිර තැන්පතුවෙන් ලැබෙන පොළිය අමුණු විසි පහක් බව ''පචවිසි අමණක වී ඉච'' යනුවෙන් සඳහන් කර තිබීමෙන් පෙනේ. මෙ අනුව වී ගොවිතැන සඳහා තැන්පත් කළ ප්‍රාග් ධනය වූ අමුණු පනහට පොළිය වශයෙන් අමුණු විසි පහක් ලැබෙන්නේ නම් වාර්ෂික පොළිය 50% කි. ගොඩ ගොවිතැනට අදාළ උඳු, මුං ආදිය තැන්පත් කිරීමේ දී ලැබෙන වාර්ෂික පොළී අනුපාතය වන්නේ 25% කි. එනම් තැන්පත් කළ ධාන්‍ය වලින් 1/4 කි. මේ අනුව තත්කාලීන ආර්ථික කටයුතුවල දී හුවමාරු මාධ්‍යය වශයෙන් මුදල් පමනක් භාවිතා නොවූ බවට මෙය කදිම නිදසුනකි. මන්දයත් පොළී ප්‍රමාණයන් ගෙවා ඇත්තේ තැන්පත් කළ ධාන්‍ය වර්ග වලින්වීම යි.

ඊට අමතරව මෙම බැංකුවේ ගනු දෙනුවල දී ක්‍රියාත්මක වූ කිරුම් මිණුම් ක්‍රම කිහිපයක් ගැන ද තෝනිගල ලිපියෙහි කියැවේ. ඒවා හකඩ, අමණක, පෙකඩ ආදී වශයෙන් සඳහන් ය. මෙහි දී හකඩ යන්නෙන් දක්වන්නේ කරත්තය යි. කරත්තයක් යනු අමුණු විස්සක වී ප්‍රමාණය කි. නැතහොත් පැලකින් 1/4 කි.

මේ අනුව තත්කාලීන සමාජයේ ක්‍රියාත්මක බැංකු ක්‍රම පිළිබඳව මෙන් ම කිරුම් මිණුම් පිළිබඳව ද තෝනිගල ලිපිය හරහා කරුණු පෙන්වා දෙන බව පැහැදිළි ය. විශේෂයෙන්ම ලිපියට අනුව මෙම බැංකුව බංකොලොත් නො වී පවත්වා ගෙන යා යුතු බව ද මෙහි සඳහන් ''අවිය කිණියෙහි'' (අඩුවීමක් හෝ හීනවීමක්) යන යෙදුමෙන් අවධාරණය කර තිබීම විශේෂත්වයක් ලෙස ගිනිය හැකි ය. එය එසේ නම් තෝනිගල සෙල්ලිපිය හරහා පෙන්වා දෙනු ලබන්නේ ක්‍රි.ව. සිව්වන සියවස වනවිට වෙළඳ ආර්ථිකය හා සම්බන්ද බැංකු පිළිබඳව අවබෝධයක් මෙන්ම සැලසුම් පිළිබඳව ද ශ්‍රී ලාංකේය සමාජය දැනුවත්ව සිටි බව යි.

**ආගමික තොරතුරු:-**

තෝනිගල සෙල්ලිපිය තුළ ඇතුලත් ව ඇති කරුනු අතර තත්කාලීන සමාජයේ ආගමික විවරණයක් ඉදිරිපත් කිරීමක් ගැන ද සඳහන් වේ. විශේෂයෙන් ම ලිපියෙ හි අරමුණ වි ඇත්තේ ද අරියවංශ උත්සවය නොකඩවා දීර්ඝ කාලීන ව පවත්වාගෙන යැම සඳහා කටයුතු සම්පාදනය කිරීමයි. එය ''අරියවස කරන මහබිකු සඟනට නියතකොටු'' යන යෙදුමෙන් පැහැදිලි වේ. මෙම යුගයේ ක්‍රියාත්මක ප්‍රධාන ආගමික උත්සවයක් ලෙස ගිනිය හැකි මෙම උත්සවය සිදුකළේ කෙසේ ද යන්න පිළිබඳව පැහැදිලි නැත. එහෙත් වංශ කථාවන් හි මෙන් ම අභිලේඛනවල මේ පිළිබඳව සඳහන් වි තිබිම නිසාවෙන් පැරණි සමාජය තුළ ක්‍රියාත්මක උසස් ආගමික උත්සවයක් බව පෙන්වා දිය හැකිය. එබඳු ආගමික කටයුතු සඳහා මෙබඳු පුද පූජා කිරිමට සහ එය මතු අනාගතයෙහි ද පැවැත්වී ම සඳහා සෙල්ලිපි පවා පිහිටුවා තිබීමෙන් එකල ගිහි පැවිදි සමාජයේ ආගමික ශ්‍රද්ධාව එමෙන් ම භක්තිය වඩාත් ස්මතුව පෙන්නුම් කරන බව කීම යුක්ති සහගතය.

ISBN 978- 955-4563- 71- 1

මඩකලපු දිස්ත්‍රික්කයේ නෙලුම්පොකුණින් හමු වූ සෙල්ලිපියක ද (Paranavitana.2001:148) එසේම අංගමුවෙන් හමු වූ ලිපියක ද (Paranavitana.2001:243) අරිය වංශ පූජාව ගැන වාර්තා වේ.

**සාමාජික තොරතුරු**

තෝනිගල ශිලා ලිපියෙන් තත්කාලීන සමාජ ජනජීවිතය හා සම්බන්ද තොරතුරු බොහෝමයක් ද අනාවරණය වේ. විශේෂයෙන් පැරණි සමාජයේ වැඩසිටි භික්ෂූන් වහන්සේලා පරිභෝජනය කළ ආහාර පාන වර්ග පිළිබඳව තතු තෝනිගල සෙල්ලිපිය සතුව පවතී. මෙහි දී ප්‍රධාන ආහාර වශයෙන් සහල්, උඳු, මුං ආදී ධාන්‍ය වර්ග මෙන්ම දී කිරි, මී පැණි, තල, දුන් තෙල්, ලුණු, පළා වර්ග, බුලත් ආදි සෙසු ආහාර වර්ග පිළිබඳව තොරතුරු සඳහන් ය. මේ අනුව සෑම ප්‍රදේශයකම පාහේ ගිතෙල්, මී පැණි, කිරි හා පළාවර්ග ආදිය මෙන්ම ඒවායෙන් සකසා ගන්නා ලද ආහාර වර්ග සුලභව පරිභෝජනය වන්නට ඇත. මේ හැර තත්කාලීන සමාජ ජනතාව කාලය මැණීම සඳහා මාස ගණනය කිරීමේ දි චන්ද්‍ර මාස ක්‍රමය භාවිතා කර ඇති බව ''අතොවසහි නිකමනිය වද පුණමස දොළස පකදිවස'' යන යෙදුමෙන් පැහැදිලි වේ.

එසේම තත්කාලීන සමාජය කෘෂිකර්මාන්තය මත පදනම් වූ දියුණු සමාජ තත්ත්වයක් මෙන්ම පුද්ගල ජන ජීවිතයක් නිර්මාණය වි තිබූ බව ද ලිපියෙහි සඳහන් සාධක අනුසාරයෙන් නිගමණය කළ හැකි ය. විශේෂයෙන් ම කෘෂිකර්මාන්තය, වෙළඳ ආර්ථිකය මත පදනම් වූ රාමුවක් තුළ තත්කාලීන සමාජයේ භෞතික සම්පත් සාදනය කර ගත්තා සේම අධ්‍යාත්මික වශයෙන් යම්කිසි දියුණුවක් ලබාගෙන ඇති බව ද වක්‍රව කරුණු ඉදිරිපත් කොට ඇත. ආර්ථික තත්ත්වය ශක්තිමත් කර ගැනීම හරහා ලෞකික ජීවිතය සාර්ථක කර ගත්තා සේම අධ්‍යාත්මික වශයෙන් ද මෙකල දියුණුවක් ලබා ඇති බව පෙනේ. රටේ පාලකයාගේ සිට සාමාන්‍ය ජනතාව දක්වා සියලුම සමාජ ස්ථරයන් නියෝජනය වන පරිදි ආගමික ක්‍රියාවන් හි නිරත වූ බවට අරියවංශ දේශනාව කෙරෙහි දක්වා ඇති සැලකිල්ල ප්‍රමාණවත් ය. ඒ අනුව තත්කාලීන සමාජ ජන ජීවිතයට අදාල සිරිත් විරිත්, චාරිත්‍ර වාරිත්‍ර, ගති පැවතුම් ආදිය ආගමික ප්‍රබෝධය හරහා සිදුවන්නට ඇති බව පෙනේ.

**නිගමනය**

ඉහත සාකච්ඡා කළ කරුණු සමාලෝචනය කිරීමේ දී යුරෝපීය ජාතිකයින් ශ්‍රී ලංකාවට නූතන බැංකු ක්‍රම හඳුන්වාදීමට පෙර සංවිධානාත්මක මූල්‍යමය පාලන ව්‍යුහයක් මෙරට ක්‍රියාත්මක වූ බව පැහැදිලිය. නූතන වාණිජවාදී බැංකු ව්‍යුහය තාක්ෂණික දැනුමෙන් සමන්විත 21 වන සියවස ස්පර්ශ කළ ද අද වන විට මූල්‍යමය පද්ධතිය තුළ යම් යම් ගැටලු උද්ගත වෙමින් පවති. විශේෂයෙන්ම භෞතික හා මානව සම්පත් කළමනාකරණයක් නොමැති වීම, සම්පත් පරිභෝජනයේ දක්වන ව්‍යාකූලත්වය, අසීමාන්තික ණය හා පොලී අනුපාත හා බැංකු පද්ධතිය පරිහානියට පත් නොවී ඉදිරියට පවත්වාගෙන යාමේ නොහැකියාව ආදී සාධක ප්‍රධාන හේතු වේ. කෙසේ නමුත් වසර දහස් ගණනකට පෙර නිවැරදි ආර්ථික කළමනාකරණ ව්‍යුහයකින් යුක්ත විධිමත් බැංකු පද්ධතියක් මෙරට ක්‍රියාත්මකව තිබූ බව උපකල්පනය කිරීමට තෝනිගල සෙල්ලිපිය ප්‍රමාණවත්ය. එය පැරණි ශ්‍රී ලංකාවේ වාණිජකරණය හා ආර්ථිකය අධ්‍යයනය කිරීමෙහිලා වැදගත් මූලාශ්‍රයකි. තවද තත්කාලීන සමාජයේ පැවති දේශපාලනික, ආගමික, සමාජික හා සංස්කෘතික පසුබිම පිළිබඳව තොරතුරු අඩු වැඩි වශයෙන් ලිපියෙහි අන්තර්ගත වීම ලිපියෙහි ඓතිහාසික වටිනාකම වඩාත් ස්මතු කරයි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

අමරවංශ හිමි, කොත්මලේ, (1969), ලක්දිව සෙල්ලිපි, ඇම්, ඩි, ගුණසේන සහ සමාගම, කොළඹ 11.
කරුණාරත්න, ඩබ්ලිව්, ඇස්. 1956, සිංහල ශිලා ලේඛන, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ.
ජයවර්ධන ඩබ්ලිව්, ඒ, (1964), ''මහසේන රජුට පසුකාලයේ රජවරු'' ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය, 1 වන කාන්ඩය, 1 වන භාගය , සංස්. නිකලස් ආටිගල ඇතුළු පිරිස, විද්‍යාලංකාර විශ්වවිද්‍යාල මුද්‍රණාලය.
ධම්මානන්ද හිමි, මකුරුප්පේ, (2004), සිංහල ශිලා ලිපි මාලා. සමයවර්ධන පොත්හල. මාලිගාකන්ද පාර, කොළඹ.
මහාවංශය (1960), ගුණපාල වීරසේකර, අනුල මුද්‍රණාලය, කොළඹ.
මුදියන්සේ නන්දසේන, (2000), සිංහල ශිලාලේඛන සංග්‍රහය, ඇස්, ගොඩගේ සහ සහෝදරයෝ, 675-පි. ද. එස්. කුලරත්න මාවත, කොළඹ 10.

**ISBN 978- 955-4563- 71- 1**

Epigraphia Zeylanica, 1933, Vol. III**,** Published for the government of Ceylon by Humphrey Mil Ford Oxford University Press Amen House, London.

Paranavitana S., (1933), Epigraphia' Zeylanica vol iii Archaeologeal, Survey of Ceylon oxford university, press A menhouse London.

Paranavitana S., 2001, Vol II, Part II, Published by The Archaeological Survey Department, Sri Lanka.